# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2240/33 - 2021 අගෝස්තු මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2021.08.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 1/2012

**1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත**

1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 11 වන වගන්තිය සමඟ කියවිය යුතු 37 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ධීවර අමාත්‍ය.

2021, ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2021 සජීවී මසුන් අපනයනය කරනු ලබන්නන් සඳහා වූ ප්‍රමිති නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල විධිවිධාන -

(අ) III වන කොටසේ විධිවිධාන හැර, විධිවිධාන මිරිදිය විසිතුරු මසුන් අපනයනය කරන්නන් හට අදාළ විය යුතු ය.

(ආ) II වන කොටසේ විධිවිධාන හැර, විධිවිධාන කරදිය විසිතුරු මසුන් අපනයනය කරන්නන් හට අදාළ විය යුතු ය.

3. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින්, සෑම පහසුකමක්ම, මේ නියෝගවල විධිවිධානවලට අනුකූල වීම පිළිබඳව, පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරනු ලැබිය යුතු ය.


1A - PG 5527 — 1520 (2021/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

*සාමාන්‍ය*

4. විසිතුරු මසුන් ප්‍රවාහනය පහසු හා වේගවත් කිරීම සඳහා සෑම පහසුකමක් වෙතම පහසු ප්‍රවේශයක් තිබිය යුතු ය.

5. සෑම පහසුකමක් ම මසුන්ගේ ගුණාත්මකභාවයට බලපෑ හැකි අපවිත්‍රතාවලින් තොර පරිසරයක පිහිටිය යුතු ය.

6. සෑම පහසුකමක් ම විසින් හොඳ තත්ත්වයේ ජල සැපයුමක්, අඛණ්ඩ විදුලිබල සැපයුමක් සහ වෙනත් පහසුකම් ප්‍රමාණවත් ප්‍රමාණවලින් පවත්වාගෙන යා යුතු ය.

7. (1) සෑම පහසුකමක් ම විසින්, අවසාදිත ටැංකි සහ ප්‍රතිකාරක ටැංකි ප්‍රමාණවත් ගණනක් තබා ගැනීම වැනි වූ අපවහන බැහැර කිරීම සඳහා වන පියවර ගත යුතු අතර පරිසරයට අහිතකර නොවන ආකාරයකින් අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු කළ යුතු ය. කාර්යක්ෂමව අපවහන බැහැර කිරීමක් සඳහා සෑම පහසුකමක්, ම විසින් මධ්‍යම පරිසර අධිකාරියේ හෝ අදාළ පළාත් පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගත යුතු ය.

(2) කාර්යක්ෂමව අපවහන බැහැර කිරීම සඳහා සෑම පහසුකමක් ම විසින් -

(අ) බැහැර කළ යුතු ජලය අවසාදිත ටැංකිවලට යැවීමට පෙරාතුව එම ජලයට විෂබීජ නාශක යෙදිය යුතු ය. එම ජලය ස්වභාවික ජල මාර්ගවලට බැහැර නොකරනු ලැබිය යුතු ය.

(ආ) මිය ගිය මසුන් කොන්ක්‍රීට් පියනක් සහිත කොන්ක්‍රීට් වලකට බැහැර කිරීම හෝ ආවරණය කරන ලද ස්ථානයක දී පිලිස්සීම හෝ කරනු ලැබිය යුතු ය.

8. ගොවිපොළ තුළ සහ ගොවිපොළෙන් පිටත පරිසරයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා සෑම පහසුකමක් ම පිරිසිදු කිරීම, අතුගෑම සහ අනෙකුත් පියවර පිළිබඳ නිරන්තර අධීක්ෂණය කිරීමක් තිබිය යුතු ය.

9. සෑම පහසුකමක් ම විසින් රසායනික ද්‍රව්‍ය, ප්‍රෝබයොටික ඇතුළු පශු ඖෂධ යන සියල්ල පැහැදිලිව ලේබල් කර සහ ආරක්ෂිතව ගබඩා කර තැබිය යුතු අතර කිසිදු අනවසර ඖෂධයක් හෝ රසායනික ද්‍රව්‍යයක් පහසුකම තුළ නොතිබිය යුතු ය.

10. සෑම පහසුකමක් විසින් ම පුද්ගලයන්ගේ, උපකරණවල සහ මසුන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.

11. සෑම පහසුකමක් ම විසින් -

(අ) ටැංකි පිරිසිදු කිරීම, සයිෆනයෙන් දියර ඇදීම සහ විෂබීජ නාශක වැඩසටහන් ;
(ආ) මසුන් පෝෂනය කිරීමේ වැඩසටහන් ;
(ඇ) ගබඩා කිරීමේ සහ මත්ස්‍ය අස්වනු ලබා ගැනීමේ වැඩසටහන් ;
(ඈ) රෝග නිවාරක ප්‍රතිකාරක වැඩසටහන් ;
(ඉ) දියර ඇදීමේ සයිෆන නළ, මත්ස්‍ය අස්වැන්න ලබා ගන්නා දැල්, අතංගු, මිය ගිය මසුන් එක් රැස් කිරීමට භාවිත කරන දැල්, බේසම් සහ බාල්දි ආදිය ප්‍රමාණවත් සංඛ්‍යාවක් පැවතීම ;
(ඊ) මිය ගිය මසුන් සහ රෝගී මසුන් ආරක්ෂිතව බැහැර කිරීම සඳහා වන පහසුකම් ;

ඇතුළුව මසුන්ගේ යහපත් සෞඛ්‍යය තත්ත්වයන් පවත්වා ගැනීම සඳහා වන පියවර ගත යුතු ය.

12. සෑම පහසුකමක් ම විසින් නිරෝධායන ටැංකිවලට ප්‍රතිජීවක භාවිත නොකිරීම වැනි වූ, පශු ඖෂධ වගකීමෙන් යුතු ව භාවිත කිරීම සහතික කිරීම සඳහා සෑම පියවරක් ම ගත යුතු ය.

13. සෑම පහසුකමක් ම විසින්, වැඩමුළු, පුහුණු කිරීමේ වැඩසටහන් හෝ සාකච්ඡාවන් සංවිධානය කිරීම මගින්, සේවකයන්ට යහපත් ජලජ සත්ත්ව සෞඛ්‍යය පිළිබඳ සහ සුබසාධන කළමනාකරණ පරිචයන් පිළිබඳ පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතු ය.

14. සෑම පහසුකමක් ම විසින් පැමිණෙන ආගන්තුකයින් සීමා කිරීම ඇතුළුව එම පරිශ්‍රයට රෝග වාහකයන් ඇතුළු වීම වැලැක්වීම සඳහා පියවර ගත යුතු ය.

15. කිසිදු පහසුකමක් විසින් යම් ලිඛිත නීතියක් යටතේ ආරක්ෂිත හෝ සන්තකයේ තබා ගැනීම තහනම් කරනු ලැබූ හෝ යම් මසුන් සහ ජලජ ශාක පරිශ්‍රය තුළ තබා නොගත යුතු ය.

16. සෑම පහසුකමක් ම විසින්, මූලික ජල ගුණාත්ව මැනියන්, ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කරන කට්ටල සහ මසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා අන්වීක්ෂයක් වැනි මූලික උපකරණ සහිත කුඩා විද්‍යාගාරයක් පවත්වාගෙන යා යුතු අතර මසුන්ගේ රෝග නිර්ණය කිරීමේ සහ අනෙකුත් විද්‍යාගාර කටයුතු පිළිබඳ පුහුණුව සහිත තාක්ෂණ ශිල්පියෙකුගේ සේවය ලබා ගත යුතු ය.

17. යම් රෝග පිළිබඳ වාර්තා වී හෝ නිර්ණය කරනු ලැබ ඇත්නම්, සෑම පහසුකමක් ම විසින්, දින හතක කාලයක් ඇතුළත එය ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර අනාගත පරිශීලනය සඳහා, නිර්ණය කරන ලද සියලු රෝග පිළිබඳ වාර්තා, පහසුකම තුළ පවත්වාගෙන යා යුතු ය.

18. සෑම පහසුකමක් ම විසින් විදේශීය ගැනුම්කරුවන්ගෙන් එක් එක් නැව්ගත තොගය සඳහා ප්‍රතිපෝෂණ වාර්තාවක් ලබා ගෙන වාර්තා කරන ලද ගැටලු විසඳීම සඳහා ප්‍රතිකර්මීය පියවර ක්‍රියාවට නැංවිය යුතු අතර අනාගත පරිශීලනය සඳහා එක් එක් නැව්ගත තොගය සඳහා විස්තරාත්මක වාර්තා තබා ගත යුතු ය.

19. සෑම පහසුකමක් ම විසින් පහත දැක්වෙන විස්තර ඇතුළත් මත්ස්‍ය තොග සම්බන්ධ වාර්තා පවත්වාගෙන යා යුතු ය :-

(අ) නිෂ්පාදනය කරන ලද දිනය පිළිබඳ විස්තර ;
(ආ) ගොවිපොළට මත්ස්‍ය තොග ඇතුල් වූ දිනය ;
(ඇ) මසුන් බෝ කරන ස්ථානයේ හිමිකරුවන්ගේ නම් ;
(ඈ) මසුන් ලබා ගත් ගොවිපොළේ හෝ කරදිය මසුන් සැපයුම්කරුවන්ගේ විස්තර ;
(ඉ) මත්ස්‍ය තොග පිටත් කර යැවීමේ විස්තර ;
(ඊ) මත්ස්‍ය ගැණුම්කරුවන්ගේ නම් ;
(උ) රෝග පිළිබඳ වාර්තා ; සහ
(ඌ) යම් පරීක්ෂණ හෝ නිරෝධායන පිළිබඳ වාර්තා.

20. සෑම පහසුකමක් ම විසින්, මසුන් ලබා ගැනීම සහ වර්ග කිරීම අංශය සඳහා පහත දැක්වෙන පියවර අනුගමනය කළ යුතු ය :-

(අ) මත්ස්‍ය තොග පහසුවෙන් පිටත් කර යැවීම සඳහා එම ප්‍රදේශයට වාහනයකින් නිසි ලෙස ප්‍රවේශ වීමේ හැකියාවක් පැවතිය යුතු ය ;

(ආ) මත්ස්‍යයින් සහිත මලු සම්බන්ධයෙන් කටයුතු කිරීම, ප්‍රදේශයේ උෂ්ණත්වය, ගොවිපොළ වෙත පැමිණෙන මත්ස්‍ය මලුවල ජලයේ ගුණාත්මකභාවය, වර්ග කිරීමේ ක්‍රියා පටිපාටිය, වර්ග කිරීමේ උපකරණ, වර්ග කිරීමේ බේසම් සඳහා වාතනය කිරීම වැනි කාරණා කෙරෙහි විශේෂ අවධානයක් දක්වමින් මසුන්ගේ ගුණාත්මකභාවය කෙරෙහි බලපෑ හැකි පීඩාකාරී තත්ත්වයන් අවම කළ යුතු ය ;

(ඇ) එක් එක් මත්ස්‍ය පැමිණීමකින් පසුව සිමෙන්ති දමන ලද හෝ පිඟන් ගඩොල් (ටයිල්) ඇතිරූ බිම්, හොඳ ජලාපවාහන පද්ධතියක්, මසුන් වර්ග කිරීම සහ ශ්‍රේණිගත කිරීම සඳහා වන කොන්ක්‍රීට් හෝ මළ නොබැඳෙන වානේවලින් තැනූ මේස යනාදියෙන් සමන්විත උපකරණ වියළා ගැනීම සඳහා වූ හැකියාව තිබිය යුතු ය ;

(ඈ) එක් එක් මත්ස්‍ය පැමිණීමකින් පසුව මසුන් වර්ග කිරීමේ මේස, බේසම්, දැල්, වාතනය සඳහා ඇති නළ, බිම සහ කාණු වැනි දේ ඇතුළු එම ප්‍රදේශය මිරිදිය භාවිත කර පිරිසිදු කළ යුතු ය ;

(ඉ) විරංජන කුඩු වැනි විෂබීජ නාශකයක් භාවිත කර සතියකට වරක් එම ප්‍රදේශයේ විෂබීජ නාශනය කළ යුතු ය ;

(ඊ) පහසුකම වෙත ලැබෙන මත්ස්‍යයින්ගේ ගුණාත්මකභාවය ඇගයීම සඳහා එසේ ලැබෙන සෑම මත්ස්‍යයකුම දෘශ්‍ය පරීක්ෂණයකට ලක් කිරීමේ හැකියාව තිබිය යුතු අතර හානි වූ වරල්, සිරුර මත සීරීම් සහිත වීම වැනි ගුණාත්මකභාවයෙන් අඩු මසුන් සැපයුම්කරුවන් වෙත, ආපසු යැවිය යුතු ය ;

(උ) අතාංගු භාවිත කර බෑග් තුළ ඇති ඇසුරුම් ජලය ඉවත් කොට මසුන් පිටතට ගෙන වර්ග කිරීමේ බඳුන් වෙත ඇතුළු කළ යුතු ය. මේ අවස්ථාවේ දී මසුන්ට මිරිදියේ ගිල්වන ප්‍රතිකාරකය (මිනිත්තු 1-2 ක්) කළ යුතු ය ;

(ඌ) මසුන් වෙන් කිරීම සඳහා භාවිත කරනු ලබන බේසම්, බාල්දි, අතංගු සහ වෙනත් භාජන වෙනත් ක්‍රියාකාරකම් සඳහා භාවිත නොකළ යුතු ය ;

(එ) එම ප්‍රදේශය පිරිසිදුව, නිසි පිළිවෙලට සහ සනීපාරක්ෂිතව යහපත් වූ ආකාරයෙන් පවත්වා ගෙන යා යුතුය.

## II වන කොටස

*මිරිදිය විසිතුරු මසුන් අපනයනකරුවන් සඳහා වූ ප්‍රමිති*

21. (1) සෑම පහසුකමක් ම විසින් නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ප්‍රදේශය සම්බන්ධයෙන් පහත දැක්වෙන පියවර අනුගමනය කළ යුතු ය :-

(අ) මසුන් අපනයනය කිරීමට පෙර නිරෝධායනය කිරීම සඳහා අපනයනය කරනු ලබන මසුන් ප්‍රමාණයට අනුව ප්‍රමාණවත් නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ටැංකි සංඛ්‍යාවක් තබා ගැනීම;

(ආ) අපනයන පහසුකම තුළ වෙන්ව වූ ප්‍රදේශයක නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ටැංකි සකස් කිරීම;

(ඇ) මසුන් ප්‍රමාණයට අනුව නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ටැංකි පිළියෙල කිරීම;

(ඈ) එක් එක් චක්‍රයට පසුව හෝ සති දෙකකට වරක් අවට ප්‍රදේශය ද ඇතුළුව සියලු නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ටැංකිවල විෂබීජ නාශනය කිරීම; හිරු එළියෙන් වියළීම වඩා යෝග්‍ය වේ.

(2) සෑම පහසුකමක් ම පහත දැක්වෙන මත්ස්‍ය නිරෝධායන කාල සීමාවන්ට අනුගත විය යුතුය:-

| | *මත්ස්‍ය ප්‍රභවය* | *නිරෝධායන කාලය* |
|---|---|---|
| 1. | අපනයනකරුගේ පහසුකම් තුළ වර්ධනය වූ මසුන් | නිරෝධායනය අවශ්‍ය නොවේ |
| 2. | තමන්ගේම බාහිර වගාකරුවන්ගෙන් ලබා ගන්නා මසුන් (අපනයනකරු විසින් බාහිර වගාකරුවන්ගේ කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයන් තිබිය යුතුය) | දින තුනක් |
| 3. | ලියාපදිංචි සෘජු සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා මසුන් (අපනයනකරුට තම සෘජු සැපයුම්කරුගේ කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් තිබිය යුතුය) | දින තුනක් |
| 4. | නොදන්නා ප්‍රභවයකින් ලබාගන්නා මසුන් | අවම වශයෙන් දින හතක් |
| 5. | ස්වාභාවික ජල මූලාශ්‍රවලින් එකතු කර ගන්නා මසුන් | සති දෙකක් |
| 6. | ප්‍රතිඅපනයනය සඳහා ආනයනය කරන ලද මසුන් | දින හතක් |

22. තත්ත්වාරෝපණ ටැංකි සම්බන්ධයෙන් සෑම පහසුකමක් ම විසින් :-

(අ) මසුන් අපනයනය කිරීමට පෙර තත්ත්වාරෝපණය කිරීම සඳහා පහසුකම තුළ ඇති අපනයනය කරනු ලබන මසුන් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ප්‍රමාණවත් තත්ත්වාරෝපණ ටැංකි සංඛ්‍යාවක් තබාගත යුතුය.

(ආ) තත්ත්වාරෝපණ ටැංකි, ඇසුරුම් කරනු ලබන ප්‍රදේශයට යාබදව වෙනම ස්ථානයක සකස් කළ යුතුය.

(ඇ) මසුන් අපනයනය කිරීමට පෙර අවම වශයෙන් පැය විසි හතරක කාලයක් තත්ත්වාරෝපණය කළ යුතුය.

(ඈ) මසුන් වෙන්ව සකස් කිරීම මගින් ක්ෂුද්‍ර ජීවීන් අන් මසුන් මගින් ආසාදනය වීම වැළැක්විය යුතුය.

(ඉ) මසුන්ගේ විවිධත්වය සහ ප්‍රමාණය අනුව තත්ත්වාරෝපණ ටැංකි තුළ, යෝග්‍ය මත්ස්‍ය තොග ඝනත්වයක්, පවත්වා ගත යුතු ය.

(ඊ) අපහසුවකින් තොරව මසුන් නිරීක්ෂණය කිරීමේ හැකියාව පවත්වා ගත යුතු ය;

(උ) අපහසුවකින් තොරව මත්ස්‍ය අස්වැන්න ලබා ගැනීමේ හැකියාව තිබිය යුතුය;

(ඌ) එක් එක් තොග නැව්ගත කිරීමකින් පසුව ටැංකිවල සහ අවට ප්‍රදේශයේ විෂබීජ නාශනය කළ යුතුය;

(එ) තත්ත්වාරෝපණ ටැංකි සඳහා පෙරනයක් හරහා ගලායන පිරිසිදු උසස් තත්ත්වයේ ඉහළම ජල ප්‍රමාණයක් තිබිය යුතුය;

(ඒ) තත්ත්වාරෝපණ ප්‍රදේශයේ වාතයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 30 ට වඩා වැඩි නොකළ යුතුය;

(ඓ) තත්ත්වාරෝපණ ටැංකි සඳහා විෂ සහිත රසායනික ද්‍රව්‍ය හෝ අනුමත නොකළ ඖෂධ භාවිත නොකළ යුතු ය.

23. ඇසුරුම් කරනු ලබන ප්‍රදේශය සම්බන්ධයෙන් සෑම පහසුකමක් ම විසින් -

(අ) එම ඇසුරුම් කරනු ලබන ප්‍රදේශයේ පරිසරය කළමනාකරණය කිරීම සඳහා ඇසුරුම් ද්‍රව්‍ය, උපකරණ, රසායනික ද්‍රව්‍ය, ලේබන නිසි පරිදි පිරිසිදු සහ ක්‍රමවත් ආකාරයකින් පවත්වා ගත යුතුය ;

(ආ) ඇසුරුම් කිරීම සඳහා යෝග්‍ය පරිදි ප්‍රතිකාර කරන ලද ජලය යොදා ගත යුතුය; සහ

(ඇ) ඇසුරුම් කිරීම සඳහා අවශ්‍ය වන ඔක්සිජන් සපයනු ලැබීම සඳහා පියවර ගත යුතු ය.

24. කිසිදු පහසුකමක් විසින් සජීවී මසුන් ස්වාභාවික ජල මූලාශ්‍රවලට මුදා නොහැරිය යුතු ය.

III වන කොටස

*කරදිය විසිතුරු මසුන් අපනයනකරුවන් සඳහා වූ ප්‍රමිති*

25. මුහුද ආසන්නයේ පිහිටුවා ඇති කරදිය මසුන් අපනයනය කිරීමේ නිරතව සිටින සෑම පහසුකමක් ම විසින් එහි අපජලය, මුහුදු ජලය අවශෝෂණය කරන වලක් හරහා මුහුදට බැහැර කළ යුතුය. පහසුකම මුහුද ආසන්නයේ පිහිටා නොමැති අවස්ථාවක දී, ජලය මුහුද වෙත ප්‍රවාහනය කිරීමට පෙර, විෂබීජනාශනය කොට කොන්ක්‍රීට් වලක තැබීම කළ යුතු ය. එවැනි බැහැර කිරීමක් මධ්‍යම පරිසර අධිකාරියේ හෝ අදාළ පළාත් පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව සිදු කරනු ලැබිය යුතු ය.

26. සෑම පහසුකමක ම නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ටැංකි සම්බන්ධයෙන් පහත දැක්වෙන දේ තිබිය යුතු ය :-

(අ) අපනයනය කිරීමට පෙර මසුන් නිරෝධායනය කිරීම සඳහා අපනයනය කරනු ලබන මසුන් ප්‍රමාණය අනුව ප්‍රමාණවත් නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ටැංකි සංඛ්‍යාවක්;

(ආ) නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ටැංකිවල ප්‍රතිසංසරණ ජල පද්ධතියක් තිබිය යුතු අතර එම ප්‍රතිසංසරණ ජලය පවිත්‍රකරණය සඳහා යාන්ත්‍රික හා ජීව විද්‍යාත්මක පෙරනයක්, ප්‍රෝටීන පෙණ ඉවත් කිරීමේ උපකරණයක් සහ පාරජම්බුල පෙරනයක් හරහා යැවිය යුතු ය;

(ඇ) මත්ස්‍යයන්, ඉස්සන් සහ වෙනත් අපෘෂ්ඨවංශීන් සඳහා නිරෝධායන පවිත්‍රකරණ හෝ රඳවා තබා ගැනීමේ ටැංකි සහිත වෙන්ව පිහිටි ප්‍රතිසංසරණ පද්ධති දෙකක් පවත්වා ගැනීම;

(ඈ) විවිධ වර්ගවල මත්ස්‍යයන් නඩත්තු කිරීම, ටැංකිවල නිසි තොග ඝනත්වයක් පවත්වාගෙන යාම සහ ආක්‍රමණශීලී මසුන් වෙනම නිරෝධායනය කිරීම;

(ඉ) මාස හයකට වරක් මිරිදිය සහ ක්ලෝරීන් හෝ පවිත්‍රකාරක වැනි සුදුසු රසායනික ද්‍රව්‍යයක් භාවිත කර අවට ප්‍රදේශය ද ඇතුළුව සියලු නිරෝධායන හෝ රඳවා තබා ගැනීමේ ටැංකිවල විෂබීජ නාශනය කිරීම; කෙසේ වුව ද මෙම ක්‍රියාවලිය අතරතුර දී ජීව විද්‍යාත්මක පෙරහන් කිරීම නතර කිරීම හෝ ඊට බාධා පැමිණවීම සිදු නොකළ යුතු ය;

(ඊ) අවම වශයෙන් දින හතක කාලයක් මසුන් නිරෝධායනය කිරීම.

27. සෑම පහසුකමක් ම විසින් නිසි ඇසුරුම් ද්‍රව්‍ය, උපකරණ, රසායනික ද්‍රව්‍ය, ලේබන සහ ඇසුරුම් කරනු ලබන ප්‍රදේශයේ ඔක්සිජන් සැපයීමේ පහසුකම් පවත්වා ගෙන යා යුතුය.

28. සෑම පහසුකමක් ම විසින් ඇසුරුම් කිරීම සඳහා නිසි පරිදි ප්‍රතිකාර කරන ලද ජලය භාවිත කළ යුතු ය.

29. මසුන්ගේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ඇසුරුම් කිරීමට පෙර බාහිර හානි, සීරීම්, අසාමාන්‍ය හැසිරීම් පිළිබඳ එක් එක් මත්ස්‍යයා තනි තනිව පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

30. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල "පහසුකම" යන්නෙන් අපනයනය කිරීමේ කාර්යය සඳහා සජීවී මත්ත්ස්‍යයන් තබා තිබෙන පරිශ්‍රය අදහස් වේ.

08-425

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.